# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල එකතු සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්: කොළඹ දිස්ත්‍රික්කය ඇසුරිනි

**සකුන්තලා සෙනවිරත්න**

saku@lib.ruh.ac.lk

පුස්තකාලයක් විසින් සපයනු ලබන සියලුම සේවාවන්හි සාර්ථකත්වය රඳා පවතින්නේ එහි එකතුව නැතහොත් දැනුම් සම්භාරය මත වේ. සාර්ථක එකතුවක් යනුවෙන් අදහස් කරනුයේ විශාල එකතුවක් නොව උපරිම අන්දමින් පරිහරණය වන එකතුවකි. එවැනි එකතුවක් ගොඩනැගීම සඳහා පුස්තකාල ද්‍රව්‍ය තේරීමේ සිට මනාව පවත්වාගෙන යාම වැදගත් වෙයි. පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා නිසි ලෙස සැපයීමට නම් පුස්තකාල එකතුව සංවර්ධනය මනා ලෙස ඉටු කළ යුතුය. විශේෂයෙන් මහජන පුස්තකාලයක් කුඩා ළමයාගේ සිට මහල්ලා දක්වා වූ සමාජයේ විවිධ තරාතිරමේ සෑම පුද්ගලයකු සඳහාම පරිහරණය කළ හැකි මහජන ආයතනයක් බැවින් එහි එකතුව ගොඩනැගීම සඳහා එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා මූලධර්ම භාවිත කිරීම අත්‍යවශ්‍යය.

එබැවින් මහජන පුස්තකාලවල එකතුව සංවර්ධනය කර ඇති ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ වේ. එකී අරමුණ ඉටු කර ගැනීම සඳහා දැනට මහජන පුස්තකාලවල ක්‍රියාත්මකවන එකතු සංවර්ධන ක්‍රියාවලිය කුමක්ද? එම ක්‍රියාවලියේ මූලික සංඝටක මොනවාද? දැනට පවතින එකතු සංවර්ධන ප්‍රතිපත්තිය කොතෙක් දුරට සාර්ථකද පුස්තකාල එකතුව පිළිබඳ පාඨකයන්ගේ ප්‍රතිචාරය කෙබඳුද, එකතුව සංවර්ධනය සඳහා පුස්තකාලයාධිපතිවරුන්ගේ දායකත්වය කෙබඳුද? ගවේෂණය කිරීම මෙහි සෙසු අරමුණු වෙයි.

පර්යේෂණය කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක ම වන  මහජන පුස්තකාල පුස්තකාලයාධිපතිවරුන් හා පුස්තකාල පාඨකයන් යොදා ගනිමින්

ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. දත්ත එකතු කිරීම සඳහා ප්‍රශ්නාවලී, සමීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා කිරීම යොදගත් අතර වගු ප්‍රස්තාර මගින් එය ඉදිරිපත් කරන ලදී.

මෙම අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය වූ ප්‍රධාන කරුණ වනුයේ ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල සඳහා නිශ්චිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යනු නොලබන බවයි. එසේම පොත් තේරීමේ කාර්යයේදී විශේෂිත කමිටුවකගේ සහයෝගය ලබා නොගන්නා අතර ඔවුන්ගේ මැදහත්වීම පිළිබඳව ද එකගතාවයක් නොමැත. නව තොරතුරු මාධ්‍ය ප්‍රතිග්‍රහණය සඳහා වැඩි නැඹුරුතාවයක් දක්වා නොමැති අතර ඊට අදාළ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේදී ද අඩු ප්‍රවණතාවයක් දක්වා ඇති බව පැහැදිලි විය.

තවද පුස්තකාලවල ඉඩකඩ පහසුව නොමැතිවීම, අඩු පුහුණු කාර්ය මණ්ඩලයක් සිටීම, නව පුස්තකාල ද්‍රව්‍යවල හිඟකම, සුදුසු සංරක්ෂණ ක්‍රම නොමැති වීම, ආදිය මූලිකව බලපා ඇත. එසේම පුස්තකාල එකතුව සංවර්ධනය කර ඇති ආකාරය සාර්ථක මට්ටමක නොමැති අතර එකතුව පිළිබඳව පාඨකයා සෑහීමකට පත් නොවන බව ද පාඨක ප්‍රතිචාරවලින් නිගමනය විය.

පුස්තකාල එකතු සංවර්ධන ක්‍රියාවලිය නිසි කළමනාකාරීත්වයකින් කිරීමට හැකිවන ලෙස සෑම මහජන පුස්තකාලයකටම සුදුසු ස්ථිර ලේඛනගත ප්‍රකාශනයක් මගින් ක්‍රියාත්මක වන ප්‍රතිපත්තියක් සකස් කිරීම, නවීන පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම, වෙනත් පුස්තකාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය සඳහා දැනුම ලත් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමක සහයෝගය ලබාගැනීම, නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වාදී ම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ, දේශන පැවැත්වීම මගින් කාර්ය මණ්ඩලය හා පාඨකයන් දැනුවත් කිරීම යනාදිය මේ සඳහා යෝජනා ලෙස ඉදිරිපත් කළ හැක.

*Key Words: Collection Development, Public Library*